*Vidvān - Ruhuna Undergraduate Academic Journal of Pali and Buddhist Studies*
*Volume I , Issue I*
*ISSN: 3121-5033*

# ලෝක ආගම්හි පැනෙන මරණින් මතු ජීවිතය : තෝරාගත් ආගම් කිහිපයක් ඇසුරින්

මාලේවන සුසීම හිමි
සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශන අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
Malewanasuseema@gmail.com

**සාරසංක්ෂේපය**

'මරණින් මතු ජීවිතය' ලෝක ආගමික දර්ශනයේ දී සාකච්ඡාවට භාජනය වන ඉතා වැදගත් ප්‍රස්තුතයකි. කිතුනු, ඉස්ලාම් හා බෞද්ධ දර්ශනයන්හි මරණින් මතු ජීවිතය පාරභෞතික ඉගැන්වීමක් වන අතර මෙම ප්‍රස්තුතයේ දී විචාරාත්මකව තොරතුරු සපයනු ඇත. මෙකී ආගම් ත්‍රිත්වයම මරණින් මතු ස්වර්ගය හා අපාය දක්වයි. බෞද්ධ දර්ශනයේදී මෙතුළින් පුද්ගල පැවැත්ම නිෂ්ඨාව නොවන බව අවධාරණය කරනු ලබන අතර බෞද්ධ නිර්වාණය ප්‍රතිවේදය තෙක් කුසලාකුසල කර්මයන්ට අනුව ස්වර්ගයට හෝ අපායට පත්වේ. තවද කෙලෙසුන්ගෙන් විනිර්මුක්ත වූ කලි සත්ත්වයා නැවත නැවත සසරට නොපමුණුවන බව අවධාරණය කරනු ලබයි. බටහිර ආගම් ද්විත්වයේ මරණින් මතු සදාකාලික ඒකීය වූ ජීවයක් ස්වර්ගයෙහි දෙවියන් තුළ ලබන අතර පවෙහි නියැලුණු පුද්ගලයා සදාකාලික අපායට පත් වේ. බුදුදහමේ දී පුද්ගල ස්වච්ඡන්දතාව මත තීරණ ගැනීමට හැකිමුත් අන්‍ය ආගම් ද්විත්වයේ දේව වචනයෙන් පරිබාහිරව තීරණ ගැනීමට නොහැකිය. මේ අනුව පෙරඅපරදිග ආගම්හි මරණින් මතු පැවැත්මේ සමවිෂමතා රාශියක් දැකිය හැකිය. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණයකි. විද්‍යමාන තම ජීවිතය මත පදනම්ව 'පරම්මරණ' හෙවත් අවිද්‍යමාන මරණින් මතු ජීවිතය සම්බන්ධයෙන් මෙම ලිපිය තුළින් ලෝක ආගම්හි සාකච්ඡාවට නැගුණු සංකල්පීය විවරණයක් මෙහිදි සාකච්ඡා කර ඇත.

***ප්‍රමුඛ පද** : බෞද්ධ, කිතුනු, ඉස්ලාම්, දර්ශනය, පාරභෞතික, පුනර්භවය*

**Article History**: **Received**: 27.03.2026 **Accepted**: 30.06.2026


*© Editor in Chief: Dr. Ven. Koggalle Wijitha, Editor: Dr. Thusitha Rajapaksha*
*Vidvān, Department of Pali and Buddhist Studies,Faculty of Humanities and Social Sciences, University of Ruhuna, Sri Lanka.*

## 1. හැඳින්වීම

මානව සමාජයේ සුවිශේෂී තැනුම් ඒකකය ආගම යි. ආගම වූ කලි මිනිසාගේ යහපත හා අයහපත විවර කරනු ලබන මාර්ගය යි. ලෝක ආගමික ඉගැන්වීම්හි මරණින් මතු ජීවිතය ඒ ඒ ආගමික සන්දර්භය මත විද්‍යමාන වේ. මෙහිලා තෝරාගනු ලැබූ කිතුනු හා ඉස්ලාම් දර්ශනයන්හි පරම නිෂ්ටාව සදාකාලික ස්වර්ගය හා අපාය පිළිබඳ විග්‍රහ කරන අතර බුදු සමයේදී කෙලෙස් දුරු කොට නිවන ප්‍රතිවේද කළ යුතු බව දැක්වේ. මෙහිදි ඉහත කී ආගම් අනුසාරයෙන් මරණින් මතු ජීවිතය පිළිබඳ කරුණු අවධාරණය කරනු ලබයි.

## 2. සාහිත්‍ය විමර්ශනය

මෙම පර්යේෂණ ලිපියට අදාළ සාහිත්‍ය මූලාශ්‍රය කිහිපයකි. ඒ අතර මූර්ති විසින් රචනා කරන ලද **ආගම සහ මියගිය ලෝකය** (2009) කෘතියෙහි මිනිසාගේම අවශ්‍යතා මත ගොඩනැගුණු ආගම් තුළින් විද්‍යාත්මක සත්‍ය, තාර්කික බුද්ධිය සැබෑ ජීවමාන ලෝකයට මිනිසා පිය නැගිය යුතුයි. නායිම්බල ධම්මදස්සි හිමියන්ගේ **දේව ධර්මවාදී ආගම්** (2004) යන කෘතියෙහි දේව ධර්මය සහ සංසන්දනාත්මක ආගම අධ්‍යයනය හරහා සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයන් ප්‍රකටය. කට්ටකඩුවේ චන්දවිමල හිමියන්ගේ **විමුක්තිය** (2011) කෘතියෙහි තෝරා ගනු ලැබූ ලෝක ආගම්හි විමුක්ති සාධනය පිණිස හේතුවන මූලික ධර්මයන් හරයාත්මකව විවරණය කොට ඇති අතර සුමනපාල ගල්මංගොඩ විසින් රචිත **ආදී බෞද්ධ දර්ශනය** (2012) නැමැති කෘතියේදී බුදුදහමේ පූර්ව භාගයේ දර්ශනය පිළිබඳ ඉතා ගැඹුරින් විශ්ලේෂණය කෙරෙයි. මෙහිදි අපගේ අධ්‍යයනය වන්නේ මරණින් මතු ජීවිතය පිළිබඳ කරුණු විග්‍රහ කිරීමයි. එසේම රිදීගම වනරතන හිමි හා දාපනේ චන්දරතන හිමියන් විසින් රචිත **ආගම් අධ්‍යයනයට ප්‍රවේශයක්** (2019) යන කෘතියේ දී පෙරදිග හා අපරදිග ආගම්හි ප්‍රධාන ඉගැන්වීම් විග්‍රහ කරයි. මෙයින් අපාය, ස්වර්ගය වැනි කරුණු අවධාරණය කරගත හැකිය. රත්ගම සුනීත හිමියන් විසින් රචිත **ලෝක ආගමික ඉගැන්වීම්** (2023) කෘතියේ දී විවිධ ආගමික ඉගැන්වීම්හි මූලාරම්භය ඉතිහාසය හා එහි මූලික හරයන් විෂද කරයි. දිල්ෂාන් මනෝජ් රාජපක්ෂ විසින් **රචිත දෘෂ්ටිවාද විචාරය හා බෞද්ධ දර්ශනය** (2017) යන කෘතියෙහි හුදු භක්ති ප්‍රණාමයට පමණක් සීමා නොවූ බවත් නූතනන දේශපාලනය හා සමාජීය න්‍යායන් අවධාරණය කරයි.

මේ අනුව ඉහත සාහිත්‍ය විමර්ශන තුළින් පැහැදිලි වන්නේ ප්‍රස්තුතගත පර්යේෂණ ගැටලුව සම්බන්ධයෙන් ශාස්ත්‍රීය ඌණතාවක් විද්‍යමාන වන බව යි.

### 3. පර්යේෂණ ගැටලුව

පාරභෞතික වූ මරණින් මතු ජීවිතය පිළිබඳ ඉස්ලාම්, ක්‍රිස්තියානි ආගම්හි පවතින ස්වච්ඡන්දතාව හා බෞද්ධ දර්ශනයේ ඉගැන්වීම් හරහා සංසන්දනාත්මකව සමර්ථනය කළ හැකි ද? යන්න විමසීම යි.

### 4. පර්යේෂණ අරමුණ

මරණින් මතු ජීවිතය පිළිබඳ අධ්‍යයනය කිරීමෙහිලා ඒ ඒ ආගමික දර්ශනයන්හි ඉගැන්වීම් මත ස්වර්ගය, අපාය හා දේව විශ්වස මත ගොඩනැගුණු පසුබිම ඉස්මතු කිරීම හා බෞද්ධ දර්ශනයේ සඳහන් පුනර්භවය පිළිබඳ විමර්ශනය කිරීම ප්‍රස්තුතයේ මුඛ්‍ය අරමුණ යි.

### 5. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය විධිමත් කර ගැනීම සඳහා ගුණාත්මක පර්යේෂණ විධික්‍රමවේදය භාවිත වන පර්යේෂණයක් වශයෙන් මෙහි තුලනාත්මක විධික්‍රමවේදය හා අවස්ථානුකූලව තාර්කික විශ්ලේෂණ පර්යේෂණ විධික්‍රමවේද ලෙස භවිත කෙරේ.

### 6. ප්‍රතිඵලය හා සාකච්ඡාව

#### 6.1 ලෝක ආගම්

ලෝක ආගම් පිළිබඳ කරුණු ගවේෂණය කිරීමේ දී ප්‍රධාන ආගමික සම්ප්‍රදායන් දෙකක් දැකිය හැකි ය. පෙරදිග ආගම් හා අපරදිග ආගම් වශයෙනි. ආගමේ ඉතිහාසය මිනිස් ඉතිහාසය තරමට පැරණි වූවකි වූවකි. වර්තමානය වන විට ලෝක ආගම් 4200 පමණ හඳුනාගත හැකිය. (සිල්වා, 2015: පි. 23) මෙම ආගම් අතුරින් ලෝකයේ පවතින ප්‍රධාන ජීවමාන ආගම් වශයෙන් ක්‍රිස්තියානි, ඉස්ලාම් හින්දු හා බුදු දහම, සික්, තාඕ, කොන්ෆියුසියස්, ජෛන, යුදෙව්, ෂින්තෝ ආදි බොහෝ ආගම් පවතී. (චන්දරතන හිමි, 2011: පි. 26) මෙම ආගම් ප්‍රාථමික අවධියේ අධිමානුෂික බලවේග ආගම ලෙස ඇදහූ අතර පසුකාලීන ලෝකයෙහි ක්‍රමානුකූලව වර්ධනය සමඟ ප්‍රාථමික ක්‍රමවේදයන් දියුණු විය. මේ අනුව සියලු ආගම් ප්‍රධාන කොටස් තුනකට බෙදුණි.

1. බහුදේවවාදය
2. එකෛකේෂ්වරවාදය
3. ඒක දේවවාදය (සිරිරතන හිමි, 2024: පි. 06)

පුද්ගලයා ඉදිරියේදී අවිනිශ්චිත සහිත සියලු දේ ස්වභාවික වස්තු සහ ආකාස්මික බලවේග දෙවියන් සේ සලකනු ලැබූ යුගය බහුදේවාදයයි. මෙම තත්ත්වයේ සංවර්ධනය වී එක් දෙවියකු ප්‍රධාන වශයෙන් ඇදහීම එකෙකේෂ්වරවාදයයි. මෙහිදී ප්‍රධානත්වයේ උසුලන දෙවියා කලින් කලට වෙනස් වන බැවින් සියලු දෙවියන්ට එක් දෙවියෙක් පත්කර ගැනීම ඒක දේව වාදය නම් වේ. මෙහිදි අවධාරණය කරනු ලබන කිතුනු හා ඉස්ලාම් ආගම් ඒකදේවවාදී වන අතර බුදුදහම දේවවාදී නොවන දර්ශනයක් වේ.

### 6.2 කිතුනු ආගමික දර්ශනයේ මරණින් මතු ජීවිතය

ලොව සෑම ආගමක් පාහේම මරණින් මතු ජීවිතය පිළිබඳ කරුණු අවධාරණය කරනු ලබයි. කිතුනු ආගමෙහි ද මරණින් මතු ජීවිතයක් පිළිබඳව ජේසුස් වහන්සේ දේශනා කළහ. එකී ජීවිතය යහපත් පැතිකඩක් කෙරෙහි නැඹුරු කර ගැනීම සඳහා නපුරු සිතුවිලි, මිනීමැරුම්, කාම මිත්‍යාචාරය, බොරුකීම තුළ ඇත්තා වු දුර්ගුණ වලකා ධර්මිෂ්ට වීම වැදගත් බව ක්‍රිස්තියානි දර්ශනයේ දී උගත හැකිය. (මූර්ති, 2009 ፡ පි. 201) ලෝකයෙහි නිරතුරුවම හොඳ සහ නරක දෑ පවතී. එනම් හොඳ හෝ නරක තෝරා ගැනීම මිනිසා සතුය. මෙම තෝරා ගැනීමේ නිදහස නිසා මිනිසා පවට වැටීමේ ප්‍රවණතාවක් දැකිය හැකි ය. (චන්දරතන හිමි, වනරතන හිමි, 2011፡ පි. 95) මිනිසාට හොඳ හා නරක නිවැරදිව තේරුම් ගැනීමට නොහැකිවූ බැවින් ඉන් මුදවා ගැනීමට දස පනත දෙවියන් වහන්සේ විසින් සීනායේ කඳු මුදුනේදී මෝසෙස්ට ප්‍රකාශ කරන ලදි. එනම්,

01. මා හැර අන් දෙවියකු සරණ නොයන්න.

02. අහසේ, පොළවේ, ජලයෙහි කිසිඳු තැනක මට සමාන දෙයක් සාදා නොගන්න. ඊට නමස්කාර නොකරන්න. ඊට සේවය නොකරන්න.

03. ඔබගේ දෙවි වූ ස්වාමින් වහන්සේගේ නාමය ව්‍යවහාර නොකරන්න.

04. සබත් දවස ශුද්ධ ලෙස පවත්වන්නට සිහිතබා ගන්න. එදින කිසිවෙකු කිසිදු වැඩක නො යෙදිය යුතු ය. මක් නිසා ද, දෙවියන් වහන්සේ අහසත් පොළවත් දින සයකින් සාදා සත්වැනි දිනයෙහි නිවාඩු ගත් සේක. එහෙයින් දෙවියන් වහන්සේ සබත් දවස විශුද්ධව ආශිර්වාද කළ සේක.

05. ඔබගේ මවටත්, පියාටත් ගෞරව කරන්න.

06. මිනී නො මරන්න.

07. කාම මිථ්‍යාචාරය නො කරන්න.

08. සොරකම් නො කරන්න.

09. අසල් වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නො කියන්න.

10. අසල්වැසියාගේ ගේට ආසා නො වන්න. අසල්වැසියාගේ බිරිඳට, වැඩකරුවාට, වැඩකාරියට, ගවයාට, කොටළුවාට හෝ අසල්වැසියාගේ කිසිදු දෙයකට ආසා නොකරන්න. (මූර්ති, 2009 : පි. 177)

මෙහි පළමු පනත් දෙස බැලූ කල්හි ගම්‍යමාන වනුයේ දෙවියන් කෙරෙහි යුතුකම් ඉටු කිරීම මෙන්ම ඉන්පසු මිනිසා මිනිසාට යුතුකම් ඉටු කළ යුතු බවයි. කිතුනු ආගමික දර්ශනයේ මරණින් පසු උරුම වනුයේ සදාකාලික ස්වර්ගය හෝ සදාකාලික අපාය යැයි ඔවුනොවුන් තුළ විශ්වාසයක් පවතී. මෙම අපේක්ෂාව සාධනය කර ගැනීමට ඉහත කී දස පනත ආරක්ෂා කිරීම සහ දේව විශ්වාසය තිබිය යුතු ය. එපමණක් නොව සදාකාලික ස්වර්ග රාජ්‍යය සැපත ලබා ගැනීමෙහිලා බරපතළ තවුස් දම් රැකිය යුතු නොවීය. (අලහකෝන්, 2004 : පි. 65) ඒ වනාහි සිදුකළ යුත්ත නම් දෙවියන් වහන්සේට ගෞරව කිරීමයි. මෙතුළින් මරණින් මතු ජීවිතය යහපත් මාර්ගයකට පමුණුවා ගත හැකි ය.

කිතුනු ආගමික ඉගැන්වීමට අනුව එහි පරම නිෂ්ටාව ස්වර්ග රාජ්‍යය ලබා ගැනීමයි. මනුෂ්‍ය වර්ගයාගේ සදාකාලික සුවය එනම් ස්වර්ග රාජ්‍යය ලබා ගැනීමෙහිලා දෙවියන් වහන්සේ සතු උනන්දුව දැක ගත හැකි ය. ''දෙවියන් වහන්සේ ස්වකීය පුත්‍රයාණන් ලෝකයට එව්වේ ලෝකයා විනිශ්චය කරනු සඳහා නොව, ලෝකයා ගලවනු සඳහායි." (මූර්ති, 2009 : පි. 200) එනම් පාපයෙන් ගලවා ගැනීමයි. මරණින් මතු ජීවිතයේ සදාකාලික ස්වර්ග රාජ්‍යය උරුම කර දීමයි. අනෙකා කෙරෙහි කරුණාවෙන් කටයුතු කිරීම ඉගැන්වීමයි. මෙමඟින් පාපිෂ්ට ක්‍රියාවන් පසෙකලා පුද්ගලයා හට යහපත දායාද කරලීම මූලික අපේක්ෂාව වේ. යුදෙව් දර්ශනයේ සඳහන් ''ජීවිතය සඳහා ජීවිතයක්, ඇස සඳහා ඇසත්, දතට දතක්, අතට අතක්, පයට පයක් දිය යුතු ය.'' (අලහකෝන්, 2004 : පි. 223) යන සංකල්පය මුළුමනින්ම ජේසුස් වහන්සේ බැහැර කරන ලදි. ජේසුස් වහන්සේගේ මූලික දර්ශනය තුළ ප්‍රකට වනුයේ කරුණාවන්ත හා දයාන්විත පුද්ගලයකු නිර්මාණය කිරීමයි. එම නිසා එතුමන්ගේ දර්ශනය තුළ ප්‍රකට වනුයේ තත්කාලීන යුදෙව් ආකල්ප බැහැර කොට දයාන්විත සංකල්ප සමාජගත කරලීමයි. ''යමෙක් ඔබගේ වම් කම්මුලට ගැසුවොත් දකුණු කම්මුලත් පාන්න" (මූර්ති, 2009 : පි. 202) කියාය. මෙම ප්‍රකාශය තුළ පුද්ගල ආකල්ප වර්ධනය සේම සදාචාරමත් සමාජයක් ඇති කිරීමට අනුශාසනා සපයනු ලබයි.

මෙම ආගම් දර්ශනයේ දී ස්වකීය අනුගාමිකයන් හික්මවා යහපත උදා කිරීමත් අයහපතින් වළක්වා ගැනීමත් දැකිය හැකිය. මරණින් මතු ජීවිතයේ ස්වර්ග රාජ්‍යයේ ලබා ගැනීම සඳහා දෙවියන්ගේ අනුකම්පාව උදාකර ගත යුතුය.

ඒ සඳහා,

1. එකම සර්ව බලධාරී දෙවියන් වහන්සේ ගැන ඇති විශ්වාසය
2. එම ප්‍රධාන දෙවියා පියා, පුත්‍රයා (ජේසුස්) හා ශුද්ධෝත්මය යන ප්‍රභේද තුනක් ඇති එම දෙවියා පිළිගැනීම
3. ජේසුස් වහන්සේ දිව්‍යමය මෙන්ම මනුෂ්‍යභාවය ඇති ගැලවුම්කරුවා ලෙස ලෝකය පාපයෙන් ගලවා ගැනීමට දෙවියන් වහන්සේ විසින් එවන ලද එකම නියෝජිතයා විශ්වාස කිරීම
4. ආගමේ මූලික සංරමන ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ විශ්වාසය තබා ගැනීම

(සිල්වා, 2015 ፡ පි. 37/38)

ඉහත කරුණු දෙස බැලූ කල්හි විද්‍යමාන වනුයේ මරණින් මතු ජීවිතයේ ස්වර්ග සම්පත්තිය හා අපාගාමී සිදු වනුයේ දෙවියන් කෙරෙහි විශ්වාසය හා දේව කැමැත්ත ඇතිවීමත් නොවීමත් මගිනි. කිතුනු ආගමට අනුව පුද්ගලයාට ස්වාධීනව වාසය කිරීමට නොහැකිය. ස්වකීය අභිමතාර්ථ සිත් සේ සාධනය කරලීමට ද නොහැකි ය. සෑම දෙයක් කෙරෙහිම දෙවියන් වහන්සේගේ ආශිර්වාදය තිබිය යුතු ය. එය අභිබවා යන්නේ වී නම් අපාගත වන පුද්ගලයා අපා ගින්නෙහි වෙලෙමින් දත්මිටි කමින් හඬනු ඇත. (චන්දරතන හිමි, වනරතන හිමි, 2011 ፡ පි. 97) දේව වචනය හා දෙවියන් විශ්වාස නොකරන තැනැත්තාගේ මරණින් මතු ජීවිතයේ සදාතනික යහපත් බවක් නොලබන අතර පුද්ගල ජීවිතයේ අමරණීයත්වයක් සාක්ෂාත් කළ නොහැකි බවයි.

කිතුනු ආගමිකයන් පවින් වැළකී යහපත් ආචාරධර්ම ඇති කර ගැනීම මෙම දර්ශනයේ මෞලික අභිලාෂය යි. සෑම ආගම් දර්ශනයකම යහපතෙහි ප්‍රතිවිරුද්ධය ලෙස දක්වනුයේ පාපය යි. ක්‍රිස්තියානි භක්තිකයෝ විමුක්තිය ලෙස සලකනුයේ පවින් මිදුණු ජීවිතයක්ය. මිනිසා පවට පත්වනුයේ පුද්ගලයාගේ ආවේණික චිත්තවේගී දුර්වලකම් නිසාය. නමුදු පාප කර්මයන් සිදු වුවහොත් පව්කමා කිරීමට කිතුනුවන්ට හැකි ය. වරද නැවත නොවීමට අධිෂ්ඨානය ඇතිව තම වරදට සමා කරන මෙන් දෙවියන්ගෙන් ඉල්ලන්නේනම් එම සමාව ඔහුට හෝ ඇයට නිරතුරුවම ලැබෙන බව ක්‍රිස්තියානි ආගමේ උගන්වන්නේය. (සාරානන්ද හිමි, 2013 ፡ පි. 106) මිනිස් ජීවිත වරකින් අවසන් නොවන්නේ යැයි කිතුනු භක්තිකයන්ට ඇති විශ්වාසය යි. ජීවිතය මරණින් පසු කෙළවර නොවන බව වෛදික හා අවෛදික දර්ශන තුළ දැකිය හැකි පොදු ලක්ෂණයකි. මරණින් මතු ජීවිතය පිළිබඳව ක්‍රිස්තියානි ආගම තුළ දෙයාකාරව දක්වා ඇත.

1. මරණින් උත්ථානය
2. මිනිසා ආත්මයකින් හා ශරීරයකින් යුක්ත වීම(සාරානන්ද හිමි, 2013 ːපි. 107)

කිතුනු දර්ශනයේ සුවිශේෂී ඉගැන්වීමක් ලෙස මළවුන්ගේ නැගිටීම දැකිය හැකි ය. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන් නැගිටීම හා ස්වර්ගයට ගිය බව ක්‍රිස්තියානි භක්තිකයෝ විශ්වාස කරති. (සුනීත ස්ථවිර, 2023 ː පි. 166) එමෙන්ම මෙම ආගම් දර්ශනයට අනුව 'යෝහොවා' දෙවියන් (චන්දරතන හිමි, වනරතන හිමි, 2019 ː පි. 73) වහන්සේ පුද්ගලයකු මිය ගිය පසු දෙවරක් විනිශ්චයට පමුණුවනු ලබත්. එනම්,

1. පුද්ගලයා මියගිය අවස්ථාවේ ලබා දෙන විනිශ්චය
2. ලෝක විනාශය සිදුවන දින සියලුම මළවුන් මරණයෙන් නැගී සිට විනිශ්චය කිරීම (චන්දරතන හිමි, වනරතන හිමි, 2019 ː පි. 98)

මෙහි පළමු අවස්ථාව නම් පුද්ගලයා මිය ගිය මොහොතේ දේව කැමැත්තට අනුව ජීවත් වූ පුද්ගලයා ස්වර්ග රාජ්‍යයට පැමිණවීම හා දේව කැමැත්තට පිටු පෑ පුද්ගලයා අපායට පැමිණවීමත් ය. එමෙන්ම ලෝක විනාශය සිදු වන දිනය පිළිබඳ අවබෝධය ඇත්තේ දෙවියන් වහන්සේට ය. ලෝක විනාශය වන කාලය වන විට ලෝකය මහත් ව්‍යසනයට පත්වේ. (වනරතන හිමි, චන්දරතන හිමි, 2019 ː පි. 98) එම දිනයේ දී සියලු මළවුන් උත්ථානය කොට අවසන් විනිශ්චය ලබාදේ. සදාතනික ස්වර්ගයට ද දේව කැමැත්තට පිටු පෑ පුද්ගලයා සදාතනික අපායට ද පමුණුවනු ලැබේ. මෙය දෙවැනි විනිශ්චය ලෙස හඳුන්වනු ලබයි. සදාතනික දිව්‍ය සම්පත් ලැබීම සඳහා දෙවියන්ට මෙන්ම අසල්වැසියාට ද ප්‍රේම කළ යුතු බව කිතුනුවෝ පිළිගන්නාහ.

මරණින් මතු වූ ජීවිතයේදී ස්වර්ග රාජ්‍යයට පිවිසීමට ඇති බාහිර ලක්ෂණ නම් බෞතිස්ම ය යි. (සුනීත ස්ථවිර, 2023ːපි.167) එනම් අවංක භාවයෙන් පරිපූර්ණත්වයට පත්වීමයි. එමෙන්ම දස පනත ද අවංකභාවයෙන් සුරක්ෂා කළ යුතු ය. මෙය ස්වර්ගයට පිවිසෙන දොරටුවයි. (සුනීත ස්ථවිර, 2023 ː පි. 173) කිතු දහමේ අවසාන විමුක්තිය හැඳින්වීමට වචන කිහිපයක් භාවිත වේ. එනම් ගැලවීම, නිදහස් වීම, සදාතනික ජීවිතය, අමරණීයත්වය ආදි වශයෙනි. (වනරතන හිමි, චන්දරතන හිමි, 2019 ː පි 49) කිතුනු භක්තිකයන් දෙවියන් වහන්සේ පිළිබඳ පවතින අවංකභාවය හා විශ්වාසය මත පුද්ගලයාට මරණින් මතු ආත්මය පවතින ස්ථාන තුනක් කිතු දහමේ පැහැදිලි කරනු ලබයි.

1. ස්වර්ග රාජ්‍යය
2. නිරය
3. ශුද්ධියට පත්ව පසුව ස්වර්ගය (චන්ද්‍රවිමල හිමි, 2011 ː පි. 44)

මරණින් මතු ජීවිතය ස්වර්ගය හෝ නිරය නිෂ්ඨාව කොට ගෙන ජීවන ක්‍රියාවලිය සිදු වේ. ශුද්ධිස්ථානයට පත්වන්නන් ස්වර්ගයට ගමන් කරන අතර නිරාගත වූවෝ සදාකාලිකවම දෙවියන්ගෙන් වෙන් වුවෝ වෙති. මොවුන්ගේ විශ්වාසයට අනුව මරණින් පසු ඇත්තේ එක් ආත්මයක් පමණි. කිතුනු භක්තිකයෝ පුනරුප්පත්තිය විශ්වාස නොකරති. (සිරිරතන හිමි, 2023 ፡ පි. 173) එපමණක් නොව සංසාරය, කර්මය වැනි සංකල්ප ප්‍රතික්ෂේප කරනු ලබන අතර මරණින් පසු ඇත්තේ එකම උපතක් පමණි. ඒ දෙවියන් වෙතින් ලබන උපතයි. (චන්දවිමල හිමි, 2011 ፡ පි. 43) මෙය යහපත් ක්‍රියා සිදුකොට අවසන් විනිශ්චයේ දී සදාකාලික ස්වර්ග රාජ්‍යය දෙවියන් වහන්සේගෙන් උදාකර ගැනීමයි. පුද්ගලයා යනු භෞතික සිරුර හා ආත්මය යන අංග දෙකක එකතුවකි. අත්පා සිරුරු වෙන්වීම මරණය නම් වේ. ඉන්පසු භෞතික සිරුර අක්‍රිය වේ. එහෙත් ආත්මය සදාතනික ය. යම් දිනක ආත්මය හා සිරුර යළි එක්වන බව ද කිතු සමිඳාණෝ වදාළහ. (චන්දවිමල හිමි, 2011 ፡ පි. 44) මේ නිසා පුද්ගලයාගේ දෙවැනි විනිශ්චය අවස්ථාවේ දී ශරීරයත් ආත්මයත් තැන තැන විසිරුණ ද භෞතිකවම උත්ථානය කරලීමට හැකි ය. මරණින් පසුව පින් පව් කළ නොහැකිය. කිතුනුවෝ සුජීවත්ව සිටියදීම මරණයට සූදානම් විය යුතු අතර පින් කළ යුතු ය. තව ද කිතුනුවාට මරණය යනු අභාවයට පත්වීමක් නොව නව ජීවිතයකට ඇතුළු වීමකි. ''මාගේ ජීවත් වීම නම් ක්‍රිස්තුස් වහන්සේ (උදෙසා) ය. මරණය ද මට ලාභයක්ය.'' (චන්දවිමල හිමි, 2011 ፡ පි. 44)

මරණින් පසු ජීවිතයේ ස්වභාවය, සිරුරේ ස්වභාවය හා උත්තානයෙන් පසු සිරුරේ ස්වභාවය සූර්යයාට, චන්ද්‍රයාට හා තාරකාවන්ට උපමා කරමින් ශුද්ධ වූ බයිබලයේ දක්වා ඇත. සූර්යයාගේ තේජස එකක් ය. චන්ද්‍රයාගේ තේජස අනෙකක් ය. තාරකාවන්ගේ තේජස ද අනෙකක් ය. මක්නිසා ද තේජසින් තාරකාවක් තාරකාවකටම වෙනස් ය. මළවුන්ගේ නැගිටීමත් එසේම ය. ජරාවෙන් යුක්තව වපුරනු ලැබේ. ජරාවෙන් වියුක්තව නැගිටිනු ලැබේ. (චන්දවිමල හිමි, 2011፡ පි. 44) දෙවියන් වහන්සේගේ දේශයට නොපැමිණි තැනැත්තා හා පාපිෂ්ඨ ජීවිතයක් ගත කළ පුද්ගලයා සදාකාලික නිරයට ගමන් කරනු ලැබේ. කිතුනු විමුක්තිය නම් ස්වර්ග රාජ්‍යයට ගමන් කිරීමයි. (චන්දවිමල හිමි, 2011 ፡ පි. 49) එම විමුක්තිය ලැබීමෙන් දෙවියන් වහන්සේගේ පුත්‍රයකු බවට පත්වීමට හැකි ය. ක්‍රිස්තියානි පැරණි දහමට අනුව විමුක්තිය යනු ස්වර්ගස්ථ වීම පමණක් නොව ලෝකයේ නිදහස් වීමක් ලෙස ද හැඳින්වේ. (චන්දවිමල හිමි, 2011 ፡ පි. 49) ක්‍රිස්තියානියේ සඳහන් පෝතෙස්තන්ත්‍ර ඉගැන්වීම්හි අනුව විමුක්තිය මරණින් මතු ලබන තත්ත්වයක් නොවන බව පැහැදිලි කරනු ලබයි. විමුක්තිය යනු ගැලවීම, මිදීම, නිදහස් වීම මිස ලෝකෙන් පැනයාම නොව එය ලෝකයේම විඳිය යුත්තකි. (චන්දවිමල හිමි, 2011 ፡ පි. 50) එබැවි මෙලෙස දැකිය හැකි ය. ''ස්වර්ගීය රාජ්‍යය ඔබ තුළ ය. එය දුර නොවේ. (ධම්මදස්සි හිමි, 2024 ፡ පි. 92) මෙලෙස ගත් කල විමුක්තිය මෙලොවම සාක්ෂාත් කළ යුත්තක් බව පෝතෙස්තන්ත්‍ර මතය යි.

ක්‍රිස්තියානි විමුක්තියේ දී පරම ගැලවුම්කරුවා දෙවියන් වහන්සේ ය. මෙහි සියලු ම දෙනා හට විමුක්තිය ළඟා කර ගැනීමටමට නොහැකි අතර අපාගාමී වූ අයෙකුට කිසි කලෙක විමුක්ති සුවය ළඟා කර ගැනීමට නොහැකි ය. ඉතා දුක්ඛිත ලෙස නිරයේ උපත ලැබ පීඩාවට පත්වීමට සිදු වේ. කිතුනු ආගම් දර්ශනයේ මරණින් මතු ජීවිතයේ පිළිබඳ විමසීමේ දී මැනවින් ප්‍රකට වනුයේ යහපත් ජීවිත ගත කරනු ලබන්නන් ස්වර්ග රාජ්‍යයටත් සෙස්සන් නිරයටත් පත් වේ.

### 6.3 ඉස්ලාම් ආගමික දර්ශනයේ මරණින් මතු ජීවිතය

අරාබි භාෂාවෙන් 'ඉස්ලාම්' යනු, අවනත වීම හෝ යටත් වීමයි. (සිල්වා, 2015 : පි. 62) එම යටත් වීම යනු අල්ලාහ් නැමැති සර්වබලධාරී දෙවියන් වහන්සේට යටත්වීමයි. මුස්ලිම්වරුන්ගේ විශ්වාසයට අනුව ඔහු මැවුම්කරුවා, දරා සිටින්නා, පෝෂණය කරන්නායි. (සිල්වා, 2015 : පි. 62) ඉස්ලාම් යන පදය ස්-ල්-ම්- යන හල් අකුරු තුනෙන් සෑදී අරාබි ධාතුවෙන් නිපන්නෙකි. (සාරානන්ද හිමි, 2013 : පි. 110) මෙහි තේරුම සාමයට පිවිසීම යනුයි.

කිතුනු දහම සේම ඉස්ලාමීය දර්ශනයේ ද මරණින් මතු ජීවිතය පිළිබඳව කරුණු අවධාරණය කරනු ලබයි. කිතුනු දර්ශනයට වඩා මරණින් මතු ජීවිතය පිළිබඳ සංකීර්ණ වූ කරුණු රාශියක් ඉස්ලාමීය දර්ශනයේ දී දැක ගැනීමට හැකි ය. කුරාණයට අනුව මරණය සමග සියල්ල කෙළවර නොවේ. (මූර්ති, 2009: පි.177) මරණය වූ කලී තවත් බලවත් ජීවිතයක ආරම්භය බව ඉස්ලාමීයන් පිළිගනී.

ලෝක නිර්මාණය සිදු කරන අල්ලාහ් දෙවියන් විසින් දූවිල්ලෙන් හා ලේ කැටිවලින් මිනිසා නිර්මාණය කරනු ලැබීය. (චන්ද්‍රවිමල හිමි, 2011: පි. 55) එහි ප්‍රතිඵල වශයෙන් වර්තමානයේදී මිනිසුන් දැක ගත හැකිය. මෙපමණක් නොව ලොවෙහි වාසය කරන සියල්ලන්ට මරණය යන්න සාධාරණ ධර්මතාවක් ලෙස ඉස්ලාම් දහමේ විශ්වාසයයි. නමුත් දෙවියන් වහන්සේ පමණක් සර්වකාලීන වේ. මරණය යනු මිනිසකුගේ ජීවිතය අවසන් වීමකි. (චන්ද්‍රවිමල හිමි, 2011: පි.55) ඉන්පසු නැවත මිනිස් ලොව ඉපදීමක් නැත. නමුත් මිනිසාගේ ජීවිතයේ මරණයෙන් කෙළවර නොවනු ඇත. මරණය තවත් ජීවිතයක ආරම්භයක් පමණි. ඉස්ලාමීය ව්‍යවස්ථාවට අනුව මිනිසා මළ පසු තැන්පත් කරන මිනී වළෙහි හෝ චිතකයෙහි සිට පරලොව ආරම්භ වේ. (චන්ද්‍රවිමල හිමි, 2011: පි.56) ඉස්ලාමීය හා කිතුනු පරලොව පිළිබඳව බොහෝ සමානකම් දැකිය හැකිය. මිනිසා මෙලොව ගත කරන ජීවිතය ඉතා අල්ප මෙන්ම කුඩා එකකි, අස්ථිරය, විනාශ වී අවසන් වෙන එකකි. එනමුත් පරලොව ජීවිතයේ එසේ නොවනු ඇත. ස්ථිර වූ අවසානයක් නොමැති විනාශයක් නොමැති එකකි. ඉස්ලාමීය මිනිසා ලොව වාසය කරමින් සිදු කරන, කළ යුතු දෑ (හලාල්) සහ නොකළ යුතු දෑ (හරාම්) තුළින් මරණින් මතු විමුක්තිය ළඟා කර ගැනීමට උපකාරීවේ. ''තවද කෙනෙකුට තව කෙනෙකුගෙන් කිසිම පිහිටක් පැතිය නොහැකි වන්නාවූ ද තවත් කෙනෙකු වෙනුවෙන් මැදිහත් වීමක් භාරගනු නොලබන්නා වූ ද කෙනෙකුගෙන් වන්දියක් නොගන්නා වූ (වැරදිකරුවන්ට) ඔවුන්ට කිසි අන්දමකින් පිහිටක් නොලබන්නා වූ ද (විනිශ්චය) දින

ගැන සිතනු.'' (අබ්දුල් අලා, 2003: පි.77) ඉස්ලාමීයන් විනිශ්චය දිනයට සූදානම් විය යුත්තේ කෙසේ ද යන්න පිරික්සා කළ යුතු ය. එනම් ඉස්ලාමයට පටහැනි නොවන හලාල් ක්‍රියාවන් සිදු කළ යුතු වේ. ඉස්ලාමියන්ගෙන් සිදු වන ප්‍රධාන පව් ලෙස සැලකෙන කරුණු කිහිපයක් දැකිය හැකිය.

1. අල්ලා දෙවියන් වෙනුවට වෙනත් දෙවියකු නැමදුම

2. ඉස්ලාම් දහමේ මූලධර්ම නොපිළිගැනීම

3. බොරු කීම

4. කාම මිථ්‍යාචාරය

5. හොරකම

6. රැවටීම හා වංචාව

7. බොරු සාක්ෂි දීම

8. බොරු චෝදනා කිරීම

9. චරිතය ඝාතනය

10. දෝෂාරෝපණය කිරීම හා එකිනෙකාගේ සිත රිදවීම (සාරානන්ද හිමි, 2013 : පි. 124/125)

යථෝක්ත කරුණු දෙස බැලූ කල්හි පෙනී යනුයේ පළමුව ඒකීය දේව සංකල්පය කෙරෙහි විශ්වාසය ඇති කිරීම හා නතු කර ගැනීමයි. අන් සියල්ලක් ම පුද්ගල විශුද්ධිය ළඟා කර ගැනීමට හා සමාජීය යහපැවැත්ම පවත්වා ගැනීමටයි. ඉස්ලාමීය දර්ශනයේ මරණින් මතු පැවැත්ම කෙරෙහි විශ්වාසය ගොඩනගා නැගීමට ඉහත කී දෑ ආරක්ෂා කළ යුතු වේ. එපමණක් නොව ඉස්ලාමීය විමුක්ති මාර්ගය සාධනය කරගැනීමෙහිලා සර්ව බලධාරී අල්ලාහ් දෙවියන්ගේ අණ පනත් අනුව කටයුතු කිරීම ඉතා වැදගත්වේ. මෙහි මූලික පියවර වශයෙන් 'ෂහාදාව' හෙවත් විශ්වාසයේ දිවුරා ප්‍රකාශ කළ යුතුය. මේ විශ්වාසයේ අංග හයකින් යුක්තය.

1. අල්හා දෙවියන් පමණක් විශ්වාස කිරීම
2. වක්තෘවරු පිළිබඳ විශ්වාසය
3. දේව ග්‍රන්ථ පිළිබඳව විශ්වාසය
4. දේවදූතයන් පිළිබඳව විශ්වාසය
5. මරණින් මතු වූ ජීවිතය පිළිබඳ විශ්වාසය
6. සියල්ල සිදුවන්නේ දෙවියන් වහන්සේගේ පූර්ව සැලැස්මකට අනුකූල බව විශ්වාස කිරීම. (චන්දවිමල හිමි, 2011: පි.56)

අවසන් විනිශ්චය හෙවත් මරණින් මතු ජීවිතය පිළිබඳ විශ්වාසය ඉස්ලාමීය පදනම වේ. එබැවි පස්වැනි කරුණින් ගම්‍යමාන වේ. ඉස්ලාමීය විනිශ්චය දිනය යනුවෙන් හඳුන්වනුයේ යම්කිසි පරමාන්ත දිනයක දී මිනිසා මරණින් නැගිටවනු ලබන බවත් එදිනම ඔහු අල්ලාහ් හමුවේ යුක්ති විනිශ්චයකට මුහුණ දිය යුතු බවත් මුහම්මද්තුමා විසින් පෙන්වා දී තිබේ. (සුනීත ස්ථවිර, 2003: පි.204) ලෝකාන්ත දිනයේ දී සියල්ල ම විනාශ වන අතර ඊට පූර්වයෙන් මිනිසා විනිශ්චයට භාජනය කරනු ලබයි. මේ දිනය 'කියාමත්' හෙවත් පරමන්ත දිනය (සුනීත ස්ථවිර, 2003: පි.205) යනුවෙන් හඳුන්වනු ලබයි. අල්ලාහ් දෙවියන් හමුවේ මරණයෙන් උත්ථානය වන මිනිසුන් මුහුණ දෙන අවසන් විනිශ්චය 'හෂර්' හෙවත් 'යළි නැගිටීම' යනුවෙන් හඳුන්වනු ලබයි. (සුනීත ස්ථවිර, 2003: පි.205) කිසියම් දිනක දී ඉහත කී පරිදි යුක්තිය හමුවේ විනිශ්චයට පත් වන බව ඉස්ලාමීයන්ගේ දැඩි විශ්වාසය යි.

ඉස්ලාමීය අවසන් විනිශ්චය දෙයාකාර වේ. මෙය 'පළමු කියාමත්' හා 'දෙවන කියාමත්' වශයෙනි. මරණයෙන් පසු මිනිසා තම සොහොන්වලින් උත්ථානය කොට හොඳ, නරක විභාග කිරීම යි. (චන්ද්‍රවිමල හිමි, 2011: පි.62) මෙහි දී ලබන නිගමනය අනුව භෞතික ශරීරයේ වෙන්වූ ආත්ම යහපත් හෝ අයහපත් ජීවිත ලබති. ඒ අනුව ලෝක විනාශයෙන් පසු සිදු කරනුයේ දෙවන විනිශ්චය යි. සදාකාලික ස්වර්ගය හෝ සදාකාලික නිරය උරුම කර ගැනීම යි. කියාමත් දිනය පිළිබඳ ඉස්ලාමීයන්ට හඳුනා ගැනීමට පෙර නිමිති සංග්‍රහයක් දක්වා ඇත. පළමු වැන්න නම් සුලු පෙර නිමිති ය.

1. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් (මොහොම්මද් තුමා) නබි වරයකු ලෙස එවනු ලැබීය.
2. සකාද් හෙවත් දෙවියන් උදෙසා කරන පරිත්‍යාග ලැබීමට කෙනෙක් නැති තරම් මිනිසුන් ධනවත් විම.
3. ෆිත්නාවන් හෙවත් අජරාම ඇතිවීම.
4. උදය කාලයේ මුඃමින්ව සිටි අය හවස් කාලය වන විට කාෆිර්යේ වෙනස් වීම.
5. නබිවරු නොවන අය නබිවරු යැ යි කීම.
6. අපරාධකරුවන් වැඩි වීම.
7. මිනීමරුවන් වැඩිවීම.
8. භූ චලන වැඩි වීම. (චන්ද්‍රවිමල හිමි, 2011: පි.62)

මෙම පෙර නිමිති මඟින් ප්‍රකට වනුයේ මිනිසාගේ විනාශය පමණක් නොව ලෝක විනාශය යි. සදාචාරාත්මක ජීවිතයෙන් තොර ව අධර්මිෂ්ඨව කටයුතු කරනු ලබන යුගයක් උදා වීම යි. එමෙන්ම ලෝක විනාශයට බෙහෙවින් ආසන්න කරුණු දහයක් කුරාණයේ හදීත්හි දක්වා ඇත. මෙය මහා පෙර නිමිති ය.

1. මහ්දි අලෛහිස් සලාම්තුමා පිටවීම.
2. දජ්ජාල් පිටවීම.
3. ඊසා අලෛහිස්සලාම්තුමා පිට වීම.
4. යඃජුජා, මඃජුජ් ගෝත්‍රිකයෝ පිටවීම.
5. තුන් සුළිය.
6. දුමක් පිට වීම.
7. සූර්යයා බටහිරින් උදාවීම.
8. භූතලයේ සත්ත්වයකු පිට වීම.
9. කහ්බාව බිඳ දැමීම.
10. ගින්නක් පිට වීම.(චන්දවිමල හිමි, 2011 ඃ පි. 63)

මෙම පෙර නිමිති පිළිබඳ යම් අවබෝධයක් ලබා ගෙන මිනිසා හරාම් ක්‍රියාවෙන් වැළකී යහපත් ක්‍රියාවේ නිරත විය යුතුය. ඉස්ලාමීය විමුක්තිය නොහොත් මරණින් පසු ජීවිතයේ ස්වර්ග සම්පත් සාධනය තොට සැනසිලිදායක සුවයෙන් සිටීමට හැකි ය. ඉස්ලාමීයන් තුළ විද්‍යමාන උත්තරීතර ඵලය පාපයෙන් මිදී ස්වර්ගය සාධනය කරලීමයි. මොවුන් අපාය වාසය සදාකාලික බව අවබෝධ කොට ගත් හෙයින් මෙහි මිතුරන් හා උදව්කරුවන් නොමැත. (චන්දවිමල හිමි, 2011 ඃ පි. 68) ස්වකීය සිතැති පරිදි මිනිසාට ජීවිතයේ කටයුතු කිරීමට නොහැකි වනුයේ මෙම කරුණු නිසාය. කිතු දහමේ මෙන්ම ඉස්ලාමීයන්ට ද යහපත අයහපත නිවැරදි පරිදි වටහා ගැනීමට නොහැකි හෙයින් දෙවියන් ඒ වෙනුවෙන් මාර්ගෝපදේශ සපයනු ලබයි. එම උපදේශයන් හරහා මරණින් පසු ජීවිතයේ යහපත් අංශයන් කරා ළඟා වීමට හැකි ය. මෙම ආගම් දර්ශනය තුළින් ද ප්‍රකට වනුයේ සමාජ සදාචාරය පවත්වා ගැනීම හා මිනිස් වර්ගයා මැනවින් හික්මවා ගැනීම යි.

### 6.4 බෞද්ධ ආගමික දර්ශනයේ මරණින් මතු ජීවිතය

කිතුනු හා ඉස්ලාමීය ආගමික දර්ශනයන්හි සාකච්ඡා කරනු ලැබූ සේම මරණින් මතු ජීවිතය පිළිබඳ බෞද්ධ දාර්ශනික මුහුණුවර මෙහිලා අවධාරණය කරනු ලබයි. පුද්ගලයාගේ උපත හා විපත පිළිබඳ බෞද්ධ දර්ශනයේ දී ඉතා සියුම්ව කරුණු අධ්‍යයනය කිරීමට හැකිය. තව ද මරණින් මතු ජීවිතය හා එකී ජීවිතය සුවපත් කර ගත යුතු ආකාරය අන් ආගම් දර්ශනයන්ට සාපේක්ෂ නොවන පරිදි බුදුදහමේ විස්තර කරනු ලබයි.

*ISSN: 3121-5033*

මරණය යනු විශ්ව සාධාරණීය ඉගැන්වීමකි. (පඤ්ඤාසාර හිමි, 2011 ෑ පි. 01) ''තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධාරං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්ස උපච්ඡේදො ඉදං වුච්චතාවුසො මරණං...'' (මජ්ඣිමනිකාය, 2005 ෑ පි. 512) ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්ව නිකායන්හි යම් චුතියක් චවනාකාරයෙක් බිඳීමක් අතුරුදහනක් මෘත්‍යු සංඛ්‍යාත මරණයෙක් කාලක්‍රියායෙක් ස්කන්ධයන්ගේ බිඳීමෙක් ශරීරයාගේ නික්ෂේපයෙක් ජීවිතෙන්ද්‍රියයාගේ උපච්ඡේදයෙක් වේ ද, ඇවැත්නි, මේ 'මරණ' ය යි කියනු ලැබේ. (මජ්ඣිමනිකාය, 2005 ෑ පි. 513) මෙහි චුති, චවනතා, අන්තරධානං යන පදවලින් ප්‍රකාශ වනුයේ නිරය, ප්‍රේතලෝකය, දිව්‍ය ලෝක, බ්‍රහ්මලෝක යන සත්ත්ව නිකායන්හි මරණය යි. (පඤ්ඤාසාර හිමි, 2011 ෑ පි. 01) මච්චු මරණ, කාලකිරියා, කලේබරස්ස නික්ඛෙපො යන්නෙන් මනුෂ්‍ය, තිරිසන් සත්ත්ව නිකායන්හි මරණය කියන ලදි. (පඤ්ඤාසාර හිමි, 2011 ෑ පි. 01) ඛන්ධානං භේදො යනු ස්ඛන්ධයාගේ මරණය යි. මෙහි නික්ඛෙපෝ යනු බහා තැබීමයි. එනම් පංචස්කන්ධයයි. මේ බැව්,

> ''අචිරං වතයං කායෝ - පඨවිං අධිසෙස්සති
> ඡුද්ධෝ අපේත විඤ්ඤාණො නිරත්ථං ව කලිංගරං,''
> (ඛුද්ධක නිකාය,2005 ෑ පි. 34)

මෙයින් පෙර කී බහා තැබීම අවබෝධ කර ගැනීමට හැකි ය. විඤ්ඤාණය ශරීරයෙන් පහු වූ කල්හි මරණය සිදුවේ. තවද සත්ත්වයාගේ ජීවය වූ ආයුෂයත්, උණුසුමත්, විඤ්ඤාණයත් පහ ව ගියේ වී නම් එය මරණය යනු යි. (චන්දානන්ද ස්ථවිර, 2011 ෑ පි. 57) ජීවිතින්ද්‍රිය සිඳී නැති වී යෑම මරණය යනුයි. මේ අනුව සමුච්ඡේද මරණ, ක්ෂණික මරණ, සම්මුති මරණ වශයෙන් මරණයේ ප්‍රධාන ආකාර තුනකි. (චන්දානන්ද ස්ථවිර, 2011 ෑ පි. 57) මරණාසන්න අවස්ථාවේ දී භෞතික ශරීරයෙන් පහව යනුයේ විඤ්ඤාණයයි.

යථොක්ත අවස්ථාවෙන් පසු උදාවෙනුයේ මරණින් මතු ජීවිතය යි. බෞද්ධ දර්ශනයට අනුව මරණය යනු පුද්ගල ජීවිතයක අවසානය නොවේ. මිනිසා කර්ම රැස් කිරීමේ ශක්තිය නැති කළ පසු නැවත ඉපදීමක් නැතැයි පෙන්වාදෙයි. (හෙට්ටිආරච්චි සහ මහතන්ත්‍රීගේ, 2003 ෑ පි. 113)''අනේක ජාති සංසාරං සන්ධා විස්සං අනිබ්බිසං ගහකාරකං ගවෙස්සන්තො දුක්ඛා ජාති පුනප්පුනං'' (ඛුද්ධක නිකාය, 2005 ෑ පි. 62) නැවත නැවත ඉපදීම දුකක් බවත්, නිවස තනන වඩුවා සොයමින් සංසාරයෙහි නොයෙක් ජාතිවල දුව ඇවිදින ලදි. මෙහි දී පංචස්කන්ධය නැමැති නිවස හදන වඩුවා නැති කළේ යැ යි ද පුනර්භවය අවසන් කිරීම යන්නයි. ''අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්බවොති...'' (සංයුත්ත නිකාය, 2005 ෑ පි. 272) යනුවෙන් නැවත ඉපදීම හැඳින්වීමට 'පුනර්භවය' යන වචනය ව්‍යවහාර වේ. (හෙට්ටිආරච්චි සහ මහතන්ත්‍රීගේ, 2003 ෑ පි. 113) මෙහි ආත්මයක ගමන් කිරීමක් ගැබ්ව ඇත.

ආත්මයක් නැතිව සසර යළි යළි ඉපදීම (පුනබ්භවො) පුනර්භවය ලෙස හඳුන්වනු ලබයි. (හෙට්ටිආරච්චි සහ මහතන්ත්‍රීගේ, 2003 : පි. 114)

බොහෝ චින්තකයින් පුනර්භවය සංකල්පය ගැන මත ඉදිරිපත් කොට ඇත. ''සතෝෂණ කිරීමට නොහැකි අමරණීය ආත්මය දේවත්වයෙන් ගිලිහී සංසාර චක්‍රයෙහි ඉපදී, නැසී, නැවත භවයකි, ගතියකි.'' යන්න පෛතගරස් නැමැති ග්‍රීක දාර්ශනිකයා පුනර්භවය යන්නට අර්ථ සපයයි. (කලන්සූරිය, 1999 : පි. 118) මෙලෙස පුනර්භවය පිළිබඳ විද්වතුන්ගේ බොහෝ අදහස් දැකිය හැකි ය. සිදුහත් බෝධිසත්ත්වයන් බුද්ධත්වයට පත්වන රාත්‍රියෙහි අවබෝධ කරගනු ලැබූ ඥාන ත්‍රිත්වයක් දැකිය හැකි ය. ''අයං බො මෙ රාජකුමාර රත්තියා පඨමෙ යාමෙ පඨමා විජ්ජා උප්පන්නා... මජ්ඣිමෙ යාමෙ දුතියා විජ්ජා අධිගතා... පච්ඡිමෙ යාමෙ තතියා විජ්ජා අධිගතා. අවිජ්ජා විහතා. විජ්ජා උප්පන්නා. තමො විහතො. ආලොකො. යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.'' (මජ්ඣිම නිකාය, 2005 : පි. 498/500) බෝධිරාජකුමාර සූත්‍රයේ දී පළමු යාමයේ දී 'පුබ්බේනිවාසානුස්සති ඥානය' නැමැති පළමු විද්‍යාව අධිගමනය කළ බව සඳහන් වේ. රාත්‍රී මධ්‍යම යාමයේ දී දෙවන විද්‍යාව උපන්නේ ය. මෙහි දී 'චුතූපපාත ඥානය' අධිගමනය කළේය. 'ආසවක්ඛය ඥානය' අධිගමනය කළේ රාත්‍රී පශ්චිම යාමයේ දී ය. බෝසතාණන් වහන්සේ පෙරවිසූ භවයන් හා ජාතීන් පිළිබඳ අනුස්මරණය කිරීමට සමත් වූයේ රාත්‍රියේ පළමු යාමයේදීය. මිය ගිය තැන නැවත උපදින සතුන් දැක ගැනීමට සමත් වූයේ චුතූපපාතඥානය ලැබීමෙනි. ත්‍රිවිද්‍යාවට අයත් මෙම ඥාන ද්විත්වයේ පුනර්භවය පිළිබඳ යැයි දැක්විය හැකිය. නැවත නැවත ඉපදීම හෙවත් පුනර්භවය නිසා මිනිසාගේ ඉපදීම සිදුවන අකාරය දැකිය හැකි ය. මානව උප්පත්තිය සිදු වන මූලික සාදක ත්‍රිත්වයකි. ''මාතාපිතරො සන්නිපතිතා හොන්ති, මාතා උතුනී හොති, ගන්ධබ්බො ච පච්චුපට්ඨිතො හොති.'' (මජ්ඣිම නිකාය, 2005 : පි. 294)

1. මව හා පියා එක්වීම
2. මව ඍතුනීව සිටීම
3. ගන්ධබ්බයාගේ පැමිණීම (හෙට්ටිආරච්චි සහ මහතන්ත්‍රීගේ, 2003 : පි. 114)

මෙහි දැක්වෙන මව්පිය සමාගමය හෙවත් ස්ත්‍රී පුරුෂ සමාගමය හා මව ඍතුනී වීම යන සාධක දෙක පුද්ගලයකුගේ උත්පත්තිය සඳහා බලපාන ප්‍රධාන සාධකයකි. 'ගන්ධබ්බ' යන පාලි වචනය 'ගන්ධර්ව' යන සංස්කෘත වචනයෙන් බිඳුනක් ලෙසත් 'ගන්තබ්බ' යන්නෙහි සංස්කරණයක් ලෙසත් විවරණය වේ. (ගල්මංගොඩ, 1994 : පි.157) ගන්ධබ්බයාගේ පැමිණීම හෙවත් 'ගන්ධබ්බ' යනුවෙන් හඳුන්වනුයේ ප්‍රතිසන්ධි විඥ්ඤාණය යි. ආගන්තුක තත්ත්වයකි. පිටතින් පැමිණෙන තත්ත්වයකි. (ගල්මංගොඩ, 1994 : පි. 158) විඥ්ඤාණය යනු පෙර භවයේ කර්ම වේගය සකස් කරන අවිච්චින්න ප්‍රවාහයකි.

*ISSN: 3121-5033*

විඤ්ඤාණය යන්න 'වි' පූර්ව 'ඤා' ධාතුවෙන් නිපන් පදයකි. (ධම්මසිරි හිමි, 2016 ፡ පි.01) විඤ්ඤාණය යන්න බහු අර්ථ ලබා දෙන පදයකි. විඤ්ඤාණය හා සංසාරය යනු එකට බැඳී ඇති දම්වැලක පුරුකක් හා සමාන ය.

සසර යනු සත්ත්වයා උපද්දමින් මරණයට පත් කරමින් ඉදිරියට ගෙන යන ස්ථානයකි. සත්ත්වයා සංසාරයට පැමිණ වීමට විඤ්ඤාණය උපකාරී වේ. පුද්ගලයා යනු නාමරූප ධර්මයන්ගේ එකතුවකි. විඤ්ඤාණය පමණක් පුද්ගලයා ලෙස බුදු දහමේ නොපිළිගනී. විඤ්ඤාණය හා නාමරූප ධර්මවල එකතුවෙන් ඇතිවන ක්‍රියාවලිය තුළ පුද්ගලයා සවිඤ්ඤාණික වන බව පැහැදිලි වනු ඇත. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පංචස්කන්ධයේ එකතුවෙන් පුද්ගලයා නිර්මාණය වේ. මෙසේ ඇති වී නැති වී ගමන් කිරීම සසර ලෙස හඳුන්වයි. (ලියනගේ, 2003 ፡ පි. 105) සසර යන්න භවයේ ගමන් කිරීම, භවයෙන් භවයට ඉදිරියට යෑම යි. බුදු දහමේ සසර යන්න විස්තර කොට ඇත්තේ මෙසේ ය. ''අනමතග්ගෝයං භික්ඛවේ සංසාරො පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණත්තං සත්තානං තණ්හා සංයෝජනානං සන්ධාවතං සංසරතං දීඝරත්තං වෝ භික්ඛවේ, දුක්ඛං පච්චානුභූතං'' (සංයුත්ත නිකාය, 2005 ፡ පි. 278) අවිද්‍යාවෙන් වැසුණු තෘෂ්ණාවෙන් බැඳුණු, සැරිසරණ සත්ත්වයන්ගේ පූර්වාන්තය නො පෙනේ. මරණින් මතු ජීවිතයේ අවිද්‍යාවෙන් යුතු වූ හෙයින් සත්ත්වයා සසරට පත් වේ. සත්ත්වයා ලෝකයෙහි ඉපදීම හා මැරීම වශයෙන් අවිද ඒ ඇවිදිම් වූ කලි එක් තැනක ඉපිද එහි ජීවත් ව සිට එහි ද මැරී තවත් තැනක උපදිමින් සිදුවන ඇවිදීමකි. මෙහි කෙළවරක් නොපෙනෙන අවිදීමකි. එබැවින් 'සසර' යැයි කියනු ලැබේ. (ධම්මසිරි හිමි, 2016 ፡ පි. 05) සත්ත්වයා සසරට පත්වනුයේ අවිද්‍යාව නිසා ය. අවිද්‍යාව යනු චතුරාර්ය සත්‍ය පිළිබඳ නොදැනීම යි.

බුදුදහම වූ කලි ''...මජ්ඣිමා පටිපදා...'' (සංයුත්ත නිකාය, 2005 ፡ පි.270) අන්තගාමී නොවන අතර පුද්ගල ස්වොත්සහයෙන් හා වීර්යයෙන් කෙලෙස් දුරු කළ යුතු ය. ''තුම්හේහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා පටිපන්නා පමොක්ඛන්ති ඣායිනො මාර බන්ධනා.'' (ඛුද්ධක නිකාය, 2005 ፡ පි. 94) කෙලෙස් තවන සම්‍යක්ප්‍රධානවීර්යය ගත යුතු අතර සර්වඥයන් වහන්සේ හුදෙක් මාර්ගෝපදේශකයකු පමණි. අත්හි දරා නිවන් නොපමුණුවති. මෙකී මඟ පිළිපැදීමෙන් මාර බන්ධනයෙන් නිදහස් වෙති.

ක්‍රිස්තියානි හා ඉස්ලාම් දර්ශනයන්හි දෙවියන් වහන්සේ කෙරෙහි ප්‍රසාදය හා අණපනත් ආරක්ෂා කරනු ලබන්නන් අවසන් විනිශ්චයේ දී හුදෙක් දේව කැමැත්ත මත සදාකාලික ස්වර්ගය හෝ නිරය ලබත්. බුදු දහමේ දී ද සදිව්‍යලෝක හා සතර අපාය සංකල්පයන් විස්තර කරනු ලබන අතර බෞද්ධ පරම නිෂ්ඨාව නම් විමුක්තිය යි, නිර්වාණය යි. දුකට සමුදය වූ තෘෂ්ණාව නැති කිරීම නිර්වාණයයි. ''නිර් + වාණ'' වාණ යනු තෘෂ්ණාව යි. (චන්ද්‍රවිමල හිමි, 2011 ፡ පි. 96) එය නැති කිරීමේ වාච්‍යාර්ථය යි. එමෙන් ම නිවන යනු අධිභෞතික වූ අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ වූ තත්ත්වයකි. ස්වකීය

අවබෝධයට පත්ව සම්මාසම්බුද්ධත්වය සාක්ෂාත් කරනු ලැබූ ශාස්තෘවරයකුට හැර සෙස්සන්ට එලෙස සාක්ෂාත් කළ නොහැකිය. බෞද්ධ දර්ශනයේ දී පුද්ගලයකු ලෞකික අභිලාෂයන් සඵල කර ගන්නා සේ ම අධ්‍යාත්මිකත්වය සාක්‍ෂාත් කළ යුතු වේ.

පුද්ගලයකු ඉපිද, ජීවත්ව, මියයෑම පිළිබඳ බුදු දහමේදී අවධාරණය නොකරනු ඇත. මංගල සූත්‍රයේ දක්වන්නා සේම ජීවිතයේ ඒ ඒ අදියරයන්හි කළ යුත්ත සිදු කළ යුතු වේ. මෙහි ජීවිතයේ අවසානය නොදක්වති. 'සොක සොචනා, සොචිතත්තං, අන්තො සොකො, අන්තො පරිසොකො, චෙතසො, පරිනිජ්ඣායිතත්තං' සෝක කිරීම, සෝක කළ බව, සෝකයෙන් වෙළී සිටීම, යළි යළිත් සෝකයට පත් වීම, එම සිතිවිලිවලින් නැවත නැවතත් පසුතැවිල්ලට පත් වීම. (සාරත්ථප්පකාසිනි, 1920 : පි. 268) නොමැතිව 'අසොකං' සෝක නොමැති බව එනම් 'විරජං' සසර රඳවන කාමාදී බැඳීම්හි නිදහස් වීමයි. (සාරත්ථප්පකාසිනි, 1920 : පි.269) මෙබඳු කරුණු අනුගමනය කොට මරුන් පැරදවා සසර දුකින් නිදහස් වීමයි.

බෞද්ධ දර්ශනයෙහි ද මරණින් මතු ජීවිතය තුළ අපාගාමී නොවී දිව්‍යලෝක හා බ්‍රහ්මලෝකයන්ට පත් වීම දක්වනු ඇත. චිත්ත විසුද්ධියට පත් වීම හෙවත් අර්හත්භාවය පරිපූර්ණ වීම සඳහා දුගතිය හෙවත් තිරිසන් ලෝකය තුළ නොහැකි බැවින් සුගති ලෝකයන්හි ස්වකීය නිෂ්ඨාව සිදු කරලීමට කාමාවචර භූමි ආධාර වේ. නමුත් සුගතියට පත් වීමෙන් පමණක් සංසාර ගමන අවසන් නොවේ. සසර අවසන් වනුයේ නිර්වාණ සුවය සාක්ෂාත් කිරීමෙන් අනතුරුවය. අන් ආගම් සියල්ලක් ම ස්වර්ගය අවසනය බව දක්වනු ලබන අතර බුදු දහම උගන්වනුයේ සාංසාරික දුක්ඛයෙන් විනිර්මුක්ත වීම යි.

## 7. නිගමනය

මරණින් මතු ජීවිතය අධ්‍යයනයේදී කිතුනු හා ඉස්ලාමීය ඉගැන්වීම් තුළ ස්වච්ඡන්දතාව ගිළිහී යන අතර බෞද්ධ දර්ශනයේදී අවස්ථාව හිමිව ඇත. එම නිසා තර්කය, අභියෝගය, අතික්‍රමණය වැනි සාධක සඳහා අවතීරණය වීමට හැකි ආගමික නිදහස ඇත. ඉහත කී බටහිර ආගම් ද්විත්වයට පොදු මතවාදය හැර ඉන් ඔබ්බට යෑමට නොහැකිය. එමෙන්ම පුද්ගල සදාචාරමත් පැවැත්ම මරණින් මතු ජීවිතය මැනවින් කියාපාන අතර ආගමික දර්ශනයන්ට අනුකූලව මරණින් මතු ජීවිතය ස්ථාවර බවත් අස්ථාවර බවත් වටහා ගැනීමට හැකිය.

## 8. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

**ප්‍රාථමික මූලාශ්‍රය**

ඛුද්දක නිකාය 1, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, පුනර් මුද්‍රණය.
පරමත්ථජොතිකා, (1920), හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ.
මජ්ඣිම නිකාය 2, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, පුනර් මුද්‍රණය.
ශුද්ධ වූ බයිබලය, (1938), ශ්‍රී ලංකා බයිබල් සංගමය, කොළඹ 10.
සංයුත්ත නිකාය 5,2, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, පුනර් මුද්‍රණය.

**ද්විතීක මූලාශ්‍රය**

අලහකෝන්, ආචාර්ය හෙක්ටර්. (2004), ක්‍රිස්තු ධර්මයේ සැඟවුණු පැතිකඩ, ගම්පහ : දීපන මුද්‍රණාලය.
එදිරිසිංහ, දයා සහ පෙරේරා, ඥානදාස. (2001), දාර්ශනික විමර්ශන, දෙහිවල: වත්මා ප්‍රකාශකයෝ.
කරුණාරත්න, සද්ධාමංගල. (2017), බෞද්ධ දර්ශනය හා චරණය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
ගල්මංගොඩ, සුමනපාල. (2012), ආදී බෞද්ධ දර්ශනය, කොළඹ: එස් ගොඩගේ.
ගමගේ, චමින්ද්‍රජිත්. (2017), අද්‍යතන ලෝක ආගම්, නුගේගොඩ: කර්තෘ ප්‍රකාශන.
චන්දවිමල හිමි, කට්ටකඩුවේ. (2011), විමුක්තිය, පුවක්පිටිය: පාලි හා බෞද්ධ අධ්‍යන ප්‍රකාශන ආයතනය.
ධර්මසිරි, ගුණපාල. (2007), දාර්ශනික ප්‍රශ්න, කොළඹ : අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
ධම්මසිරි හිමි, මැටිබැඹියේ. (2016), විඤ්ඤාණය (සූත්‍රාගත බෞද්ධ විග්‍රහය), කොළඹ: එස් ගොඩගේ.
ධම්මදස්සි හිමි, නායිම්බල. (2004), දේවධර්මවාදී ආගම්, කොළඹ: එස්.ඇන්ඩ්.එස්. ප්‍රින්ටර්ස්.
පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ. (2016), බෞද්ධ දර්ශනය, කොළඹ: එස් ගොඩගේ.
පැට්රික්, නාරවිල. (2003), බයිබලයේ දාර්ශනික චින්තනය, කොළඹ: එස්. ගොඩගේ.
මූර්ති. (2009), ආගම සහ මියගිය ලෝකය, කොළඹ: මයුර ප්‍රකාශකයෝ.
මනෝජ් රාජපක්ෂ, දිල්ෂාන්. (2017), දෘෂ්ටිවාද විචාරය හා බෞද්ධ දර්ශනය, කොළඹ: එස් ගොඩගේ.
විජිතනන්ද හිමි, ගලෙන්බිඳුණුවැවේ. (2009), බුදු දහම හා කිතු දහම, මීගමුව: අකුර පොත් ප්‍රකාශකයෝ.
වනරතන හිමි, රිදීගම. චන්දරතන හිමි, දාපනේ. (2019), ආගම් අධ්‍යයනයට ප්‍රවේශයක්, කොළඹ: එස් ගොඩගේ.
සාරානන්ද හිමි, දුනුකේඋල්ලේ. (2013), සමයාන්තර ආගම් තුලනය, ජා ඇල : සමන්තී පොත් ප්‍රකාශකයෝ.
සුනීත ස්ථවිර, රත්ගම. (2023), ලෝක ආගමික ඉගැන්වීම්, කර්තෘ ප්‍රකාශකි.
සිරිරතන හිමි, ඉරුදෙණියායේ. (2024), ශ්‍රී ලංකාවේ ආගම්, කුලියාපිටිය : වර්ණ ප්‍රින්ටස්.
ෆාතිමා, අල්. (2003) (සංස්.). අල් කුරාණ අර්ථ විවරණය, ශ්‍රී ලංකා ජමාආත් ඒ ඉස්ලාමි ප්‍රකාශනයකි.